# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 711 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 25/04/2024<br>පැය 2150 | | |

## මාධ්‍ය නිවේදනය

**පාසල් අවට මත්ද්‍රව්‍ය වලින් තොර සුරක්ෂිත කලාපයක් බවට පත් කිරීම සඳහා "පවුර සංසදය" නමින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම - පොලිස් මූලස්ථානය.**

පාසල් අවට මත්ද්‍රව්‍ය වලින් තොර සුරක්ෂිත කලාපයක් බවට පත් කිරීම සඳහා "**පවුර සංසදය**" කමිටු 5022 ක් දිවයින පුරා පිහිටුවා අවසන් කර ඇති අතර එම කමිටු සාමාජිකයින් වෙතින් අපේක්ෂිත කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ පළමු අදියර ලෙස බස්නාහිර පළාතේ පිහිටුවා ඇති කමිටු දැනුවත් කිරීමේ නියමු ව්‍යාපෘති වැඩසටහනක් **පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන්** 2024.04.25 වන අද දින පස්වරු 03.00 ට කොළඹ ආනන්ද විද්‍යාලයේ කුලරත්න සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

ප්‍රජා පොලිස් , සංචාරක හා ආයෝජන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංක කරවිට, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න, අපරාධ දිසාව හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නිහාල් තල්දුව, ප්‍රජා පොලිස් හා පරිසර ආරක්ෂණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් සේරම්, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති අයි.එම්. කරුණාරත්න හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති නීතිඥ ශාක්‍ය නානායක්කාර යන මහත්වරුන් ඇතුළු උසස් නිලධාරීන් පිරිසක්ද කොළඹ ආනන්ද, නාලන්දා, රාජකීය, සහිරා හා අශෝක යන විද්‍යාලවල විදුහල්පතිවරුන් ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




POLICE


පවුර සංසඳය
නියමු ව්‍යාපෘතිය
බස්නාහිර පළාත
2024.04.25 කොළඹ ආනන්ද විද්‍යාලයේ කුලරත්න සම්මන්ත්‍රණ ශාලාවේදී
ප්‍රජා පොලිස් කොට්ඨාසය





**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**